19



# පින්බර ලක් මව

1. අනුරාපුර පොළොන්නරුව සීගිරි මනබන්දනීය  
කුලුනු පිළිම බිතු සිතුවම් නන් සිතුවිලි රංජනීය  
නන් සිතුවිලි රංජනීය

2. පස් පියුමෙන් පිරුණු පොකුණු රේණු හැලී රන් පාටය  
ඉන් නැහැවී නිල් ගැන්වෙන ගොයම් තලා පින් පාටය  
ගොයම් තලා පින් පාටය

3. වසන්තයේ හිරිමල් වන බිඟු ගී මිහිරෙන් පිරෙන්නෙ  
මහියංගණ කැලේ සැදෙන මී වදවල පැණි පෙරෙන්නෙ  
මී වදවල පැණි පෙරෙන්නෙ

4. මින්නේරිය අබය වාපි තෝපා ගිරිතලේ සිරිය  
විසිතුරු ඇති ගී ගයන්න සරසවි දේවිටත් බැරිය  
සරසවි දේවිටත් බැරිය

5. සිහින් සේද ඉග ලා ගත් පළිඟු කුමාරියක රුවට  
දියලුම දිය ඇලි දේවිය සිහින ලොවක් කෙරෙයි අවට  
සිහින ලොවක් කෙරෙයි අවට

6. ගංගා නිල්වලා මාල හංගා රතු කැට දිය යට
ගංගා ලිය ගලා බසියි ගිරි පෙළ කරවා පිය ගැට
ගිරි පෙළ කරවා පිය ගැට

7. පනාමුරේ කුංච නාද රැව් පිළිරැව් දෙයි දෙවේලෙ
තාලෙට ගොවි බිමට බසියි කිරි ඉතිරෙන කුණ්ඩසාලෙ
කිරි ඉතිරෙන කුණ්ඩසාලෙ

8. වෙසක් මහේ කැකුළු බුරුතු හිනැහී ඇස් නටවන විට
ගසක් නැර හැම ළැහැබ ම පෙරළෙයි මනමාලියකට
පෙරළෙයි මනමාලියකට

9. මාල ගිරා රංචු ගැසී ජයමංගල ගී ගයන්නෙ
කජු නාඹර නරඹන විට ඒ ගැයීම නතර වෙන්නෙ
ඒ ගැයීම නතර වෙන්නෙ

10. සීගිරි ගී සරසන කැටපත් පවුරට එබී බලන
දෙනෙතට හමු වන්නෙ ලොවකි සිඟිති කලා පිළිබිඹු වන
සිඟිති කලා පිළිබිඹු වන

11. පේන මානෙ නිල් හැඩවන් උෟව කලා සුන්දරීය
මිණිමුතු මත වැඩෙන අපේ ලක් මව හරි පින්බරීය
ලක්මව හරි පින්බරීය

රේඛාව චිත්‍රපටයේ විරිදු
ගායනය - අයිවෝ ඩෙනිස්
පද මාලාව - කලාශූරි ගරු
මර්සලින් ජයකොඩි පියතුමා



## පැහැදිලි කිරීම්

**වාපි** – වැව්

**මිණිමුතු** – මැණික් සහ මුතු

**පස් පියුම්** – සුදු නෙළුම්, රත් නෙළුම්, මානෙල්, ඕලු, කුමුදු

**සරසවි දේවිය** – සරස්වතී දේවිය කාව්‍ය ශාස්ත්‍රවලට අධිපති දිව්‍යාංගනාවකි

## අවබෝධය සහ රස විඳීම

1. රබානක් වාදනය කරමින් මෙම විරිඳු ගායනා කරන්න.
2. කණ්ඩායම්වලට බෙදී එක් එක් කණ්ඩායම එක් විරිඳුවක් බැගින් ගායනා කරන්න. ඒවායේ අදහස ද ඉදිරිපත් කරන්න.
3. මෙම විරිඳු පෙළෙහි සඳහන් වන කරුණු පහත දැක්වෙන ශීර්ෂ යටතේ වර්ග කරන්න.
   - ❒ **ස්ථාන**
   - ❒ **පක්ෂීන්**
   - ❒ **වැව්**
   - ❒ **සතුන්**
   - ❒ **ගංගා**
   - ❒ **කෘමීන්**
   - ❒ **දිය ඇලි**
   - ❒ **නිර්මාණ**
4. ශ්‍රී ලංකාව ඉතා අගනා රටක් ලෙස කවියා දක්වන්නේ කුමක් නිසා ද?
5. මෙම විරිඳු සමූහයෙන් ඔබ වඩාත් ම කැමති විරිඳුව තාලයට ගායනා කරන්න. එහි අදහස කියන්න.

**භාෂා ක්‍රියාකාරකම්**

6. මෙම විරිදු පන්තියෙහි බින්දුව යෙදෙන වචන සහ සඤ්ඤක අකුරු යෙදෙන වචන සොයා ලියන්න.

| බින්දුව යෙදෙන වචන | සඤ්ඤක අකුරු ඇති වචන |
|---|---|
| මහියංගණය | බිඟු |

7. පහත දක්වෙන අදහස් විරිදු පෙළෙහි පැවසෙන්නේ කෙසේ දැයි උපුටා දක්වන්න.
   i. මින්නේරිය ආදි වැව්වල විසිතුරු බව සරසවි දේවියටත් විස්තර කළ නොහැකි ය.
   ii. දියලුම දිය ඇල්ල පළිඟු කුමාරියක මෙන් අවට පරිසරය සිහින ලොවක් බවට පත් කරයි.
   iii. වෙසක් මාසයේ හැම වන ළැහැබ ම මනමාලියක සිරි ගනියි.
   iv. සීගිරි කැටපත් පවුරේ කලා නිර්මාණ හැකියාවන් පෙනෙයි.

8. කවියා යොද ඇති නාම පද ලියා හිස් තැන් පුරවන්න.
   i. මහියංගණ කැලේ සැදෙන ...................
   ii. පස් පියුමෙන් පිරුණු .................
   iii. කිරි ඉතිරෙන ...................
   iv. මිණිමුතු මත වැඩෙන අපේ ....................

9. වරහන් තුළින් නිවැරදි ආඛ්‍යාතය තෝරා ලියන්න.

   i. දියලුම දිය ඇලි දේවිය අවට සිහින ලොවක් ................ (කරයි, කරති)

   ii. ගංගා ලිය ගලා ................. (බසිති, බසියි)

   iii. පනාමුරේ කුංච නාද රැව් පිළිරැව් .............. (දෙති, දෙයි)

   iv. මහියංගණයේ මී වදවල පැණි............. (පිරෙයි, පිරෙති)

## පැවරුම්

1. මෙම විරිදු පෙළෙහි සඳහන් වන වැව් තැනූ රජවරුන් ගැන සොයා දැනගන්න.
2. **සරසවි දේවිය, සීගිරිය සහ කැටපත් පවුර, ශ්‍රී ලංකාවේ දිය ඇලි** යන මේවා ගැන වැඩිදුර කරුණු සොයන්න.
3. **දේශාභිමානී ගීත** එක්රැස් කර පොත් පිංචක් සාදන්න.